**ශීර්ෂ 322 - උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව පිළිබඳව විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුමක්ද, සැසඳුම් ප්‍රකාශයක්ද සහ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1.2 වගුවේ ඇතුළත් ආදායම් සංකේතවලට අදාළ ආදායම් ගිණුමක්ද, උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, ගණන්දීමේ නිලධාරීගේ හා ආදායම් ගණන් දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයිම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරින් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන් වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 322 - උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 මැයි 30 දින අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

**1.4. විගණන නිරීක්ෂණය**

**------------------------**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදි අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.10 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටු කිරමේ දී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශ ගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි** | **මුදල් රෙගුලාසි 128 ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | **ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගතවී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| 128(1)(අ) | රජය විසින් නියම කර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරිමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දැරූ බව, | 1. අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම | 2.1 |
| | | 2. මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානයේ නේවාසික පුහුණු වැඩසටහන් සඳහා සැලැස්මක් පිළියෙල නොකිරිම | 2.3.1.(ආ) |
| | | 3. කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට සැලැසුම් නොකිරිම | 2.10(ආ) |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව, | 1. විධිමත් අනුමැතියකින් තොරව කම්කරුවන් සේවයේ යෙදවීම | 2.10 (අ) |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඉ) | රජය සතු වු හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව, | 1. ගනේවත්ත වන ඖෂධ උද්‍යානයේ දෙමහල් ගොඩනැගිල්ල ඌන උපයෝජනය | 2.3.1.(අ) |
| | | 2. නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිත වත්කම් | 2.3.2 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව, | 1. හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත්වීම | 2.9 |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව, | 1. ඕකිට් ගෘහයේ වැඩ කටයුතු අවසන් නොකිරීම | 2.2(අ) |
| | | 2. හක්ගල උද්භිද උද්‍යානයේ ආපන ශාලාව බඳුදීමේදී රු.526,500 ක මූල්‍යමය අලාභය | 2.2.(ආ) |
| | | 3. ආරක්ෂක දැල් රෝල් 100 ක් රු.960,000 ක මිලදී ගෙන භාවිතයට ගෙන නොතිබීම | 2.5 |
| | | 4. ගොල්ෆ් කාර් ආදායම අඩුවීම | 2.6.(අ) |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඒ) | දරන ලද කිසියම් වියදමක් හෝ වගකීමක් බැදීමක් වුවද, තම වැය විෂය පථය හෝ සීමාවන් හෝ වෙනත් බලය දෙනු ලැබූ මූල්‍ය ප්‍රතිපාදනයක් ඇතුළත වැටෙන බවට හා එය ප්‍රමාණවත් තරම් අධිකාර බලයෙන් ආවරණය වන බව, | 1. ප්‍රතිපාදන ඉක්මවා බැදීම්වලට එළඹීම.<br>2. අධිප්‍රතිපාදන සලසා තිබීම | 2.4.(අ)<br>2.7 |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරී වශයෙන් තමා වගකීමට බැදී සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන බව, | 1. හෙළිදරව් නොකළ බැරකම් | 2.4.(ආ) |
| 128(2)(ඵ) | අවශ්‍ය තන්හි ආර්ථික ක්‍රමයේ හා වෙනත් තත්ත්වයන්ගෙන් වෙනස්වීම් ගැන සැලැකිලිමත්ව, බදු සහ ගාස්තු ආදිය අයකිරීම් සමාලෝචනය කර ඒවා ප්‍රතිශෝධනය කිරීමට නිසි පියවර ගන්නා බව, | 1. සංශෝධන මිල ගණන් පැල විකිණීමේදී භාවිතා නොකිරීම නිසා සිදු වූ අලාභ | 2.6.(ඇ) |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 2.1 කාර්යසාධනය

-----------------

**අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

--------------------------------------------

ඖෂධ පැළ හා ශාක නඩත්තුව පිළිබඳ පුහුණු මධ්‍යස්ථානයක් ලෙස සහ පැළ නිෂ්පාදනය හා බෙදාහැරීමේ තවානක් ලෙස මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය 2008 වර්ෂයේදී ස්ථාපිත කර තිබුණි. එම මධ්‍යස්ථානය ස්ථාපිත කර වර්ෂ අටහමාරක් ක් පමණ කාලයක් ගත වී තිබුණත්, 2016 වර්ෂය අවසාන වන විටත්, කිසිදු පුහුණු වැඩසටහනක් පවත්වා නොතිබුණි. 2017 වර්ෂයේදී මල් වගාව පිළිබඳ මාසයකට වරක් එක් පුහුණු වැඩසටහනක් බැගින් පවත්වා තිබුණි.

### 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

-----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගම්පහ උද්භිද උද්‍යානයේ නරඹන්නන්ගේ ආශ්වාදය වැඩි කිරීමේ අරමුණ ඇතිව 2013 වර්ෂයේදී රු.මිලියන 15.85 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත 2013 වර්ෂයේ ඉදිරිපත් කළ යෝජනාවක් අනුව

2015 වර්ෂයේ ඕකිඩ් ගෘහයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. 2017 ඔක්තෝබර් 09 දින වන විටත් එහි වැඩ කටයුතු අවසන් කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේදී රු.මිලියන 2.39 ක් වැය කර හක්ගල උද්භිද උද්‍යානයේ ඉදිකරන ලද නව ආපන ශාලාව සේවක සුභසාධක සංගමය විසින් බදුදී තිබුණි. ටෙන්ඩර් කැඳවීම, සුදුසු ටෙන්ඩර්කරු තේරීමද එම සංගමය විසින් සිදු කර තිබුණි. ටෙන්ඩරය පිරිනැමීමේදී රු.802,500 ක් හා රු.625,750ක් වශයෙන් ඉදිරිපත් කර තිබුණු ටෙන්ඩර් පත් සුභසාධක සංගමයේ ව්‍යවස්ථාවට අනනුකූල යැයි සඳහන් කර ප්‍රතික්ෂේප කර රු.276,000 කට ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණි. ඉදිරිපත් වී තිබුණු උපරිම මිල සැලකිල්ලට ගත්විට ටෙන්ඩරය ප්‍රදානය කිරීමෙන් රු.526,500 ක් මූල්‍යමය අලාභයක් සිදු වී තිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

### 2.3.1 රජය සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා නොකිරීම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සඳහා දෙමහල් දේශන ශාලා ගොඩනැගිල්ලක් රු.23,397,342 ක් වැය කර 2016 වර්ෂයේදී ඉදිකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ මුල් මාස 08ක කාලය තුළ පුහුණු සැසි 06 ක් පමණක් පවත්වා තිබුණි. ඒ අනුව මෙම දෙමහල් ගොඩනැගිල්ල දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් ඉටු කිරීමට උපරිම වශයෙන් යොදා ගෙන නොතිබුණි.

(ආ) මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානයේ රු.7,418,000 ක් වැය කර නේවාසික පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් නේවාසිකාගාරයක් 2017 වර්ෂයේදී ඉදිකර තිබුණි. 2017 මැයි මාසයේදී ඒ සඳහා රු.700,525 ක් වැය කර ගෘහ භාණ්ඩ හා උපකරණද මිලදී ගෙන තිබුණි. නමුත් නේවාසික පුහුණු වැඩසටහන් පැවැත්වීම පිළිබඳව සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 2.3.2 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ගකර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රියව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම | නිෂ්ක්‍රියව පැවති කාලය |
|---|---|---|---|---|
| | | | රු. | |
| (i) | වාහන | 04 | හඳුනාගත නොහැක. | මාස 02 - වර්ෂ 01 දක්වා |
| (ii) | ගොඩනැගිලි | 01 | 7,418,000 | වර්ෂ 01 |
| (iii) | ගෘහ භාණ්ඩ | - | 700,525 | මාස 08 |

## 2.4 බැදීම් හා බැරකම්

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම**

----------------------------------------------------

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 09 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 76.8 ප්‍රතිපාදනය ඉක්මවා රු. මිලියන 4.8 ක බැදීම් ඇති කරගෙන තිබුණි.

**(ආ) හෙළිදරව් නොකළ බැරකම්**

--------------------------------

සමාලෝචිත වර්ෂයට අදාළ රු.413,805 ක බැරකම් 2018 වර්ෂයේ මුල් කාර්තුව තුළ අවස්ථා 15 කදී ගෙවා තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය සඳහා විගණනයට ඉදිරිපත් කළ විසර්ජන ගිණුමේ ඇතුළත් බැරකම් ප්‍රකාශනයෙහි එම බැරකම් සඳහන් කර නොතිබුණි.

## 2.5 අනාර්ථික ගනුදෙනු

---------------------

උද්‍යානය වටා ආරක්ෂක වැටක් ඉදිකිරීම වෙනුවෙන් 2016 වර්ෂයේදී රු.960,660 කට මිලදී ගත් ආරක්ෂක දැල් රෝල් 100 ක් විගණන දිනය වූ 2018 මාර්තු 16 දින වන විටත්, භාවිතයට නොගෙන උද්‍යාන පරිශ්‍රයේ ස්ථාන ගත කර තිබුණි.

## 2.6 කළමනාකරණ දුර්වලතා

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හක්ගල උද්‍යානය සතුව ආසන 03 ගොල්ෆ් කාර් රථ 02 ක් හා ආසන 07 ගොල්ෆ් කාර් රථ 02 ක් විගණන දිනය වූ 2017 ඔක්තෝබර් 10 දින වන විටත් පැවතුණි. ගොල්ෆ් කාර් ධාවනය කිරීමෙන් 2017 සැප්තැම්බර් මාසය දක්වා ලබා ගෙන තිබුණු මාසික ආදායම පසුගිය වර්ෂයේ අදාළ මාස අනුව ලබා ගෙන තිබුණු මාසික ආදායම් සමඟ සැසඳීමේදී, සමාලෝචිත වර්ෂයේදී එක් එක් මාසවල උපයා තිබුණු ආදායම සියයට 34 ක සිට සියයට 82 ක් අතර පරාසයක ප්‍රමාණයකින් අඩුවී තිබුණි.

(ආ) ගනේවත්ත වන ඖෂධ උද්‍යානයේ පාසල් ශිෂ්‍යයන්, ආයුර්වේද වෛද්‍ය ශිෂ්‍යයන් හා විවිධ අධ්‍යයන සඳහා පැමිණෙන ගවේෂකයින්හට ඖෂධ වර්ග හඳුනාගැනීමට හා අධ්‍යයනයට පහසුවන පරිදි ශාක නිවැරදි නාමකරණය, විස්තරාත්මක නාම පුවරු සැකසීම, ශාකාගාරයේ ශාක නිදර්ශක සකස් කිරීම, ජලීය මාධ්‍යයේ සංරක්ෂණය කරන ශාක කොටස් පෙන්වීමට සැලැස්වීම, ඖෂධ ශාකවල වියළි ඖෂධ කොටස් ප්‍රදර්ශනයට සැලැස්වීම හා උද්‍යානය තුළ වගා කිරීමට නොහැකි ඖෂධ ශාක ඡායාරූප මගින් නැරඹීමට රූප එකතුවක් ඇති කිරීම වැනි ක්‍රියාකාරකම් කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) 2017 ජනවාරි 01 දින සිට විකුණනු ලබන පැළවලට අදාළව මිල සංශෝධනයක් සිදුවී තිබුණද, මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය 2017 අගෝස්තු 01 දින සිට ක්‍රියාත්මක කිරීම නිසා 2017 ජනවාරි 01 දින සිට අගෝස්තු 01 දින දක්වා විකුණූ පැළවලින් රු.12,380 ක ආදායමක් අහිමි වී තිබුණි.

## 2.7 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 2013 | **පුනරාවර්තන** | 226.95 | 208.29 | 18.66 | 8.22 |
| | මූලධන | 598.15 | 424.44 | 173.71 | 29.04 |
| | එකතුව | 825.10 | 632.73 | 192.37 | 23.31 |
| 2014 | **පුනරාවර්තන** | 236.54 | 236.46 | 0.08 | 0.03 |
| | මූලධන | 425.30 | 419.55 | 5.75 | 1.35 |
| | එකතුව | 661.84 | 656.01 | 5.83 | 0.88 |
| 2015 | **පුනරාවර්තන** | 337.21 | 332.79 | 4.42 | 1.31 |
| | මූලධන | 369.30 | 349.22 | 20.08 | 5.44 |
| | එකතුව | 706.51 | 682.01 | 24.49 | 3.47 |
| 2016 | **පුනරාවර්තන** | 349.52 | 348.72 | 0.79 | 0.23 |
| | මූලධන | 287.80 | 285.92 | 1.88 | 0.65 |
| | එකතුව | 637.32 | 634.64 | 2.68 | 0.42 |
| 2017 | **පුනරාවර්තන** | 364.69 | 358.28 | 6.41 | 1.76 |
| | මූලධන | 300.05 | 297.56 | 2.49 | 0.83 |
| | එකතුව | 664.74 | 655.84 | 8.90 | 1.34 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**අධි ප්‍රතිපාදන සලසා තිබීම**

සමාලෝචිත වර්ෂයේ මූලධන වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක් හා සියයට 21 ක් වී තිබුණි.

## 2.8 ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම

දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය සඳහා 20.03.02.19 දරන ආදායම් සංකේතය සඳහා රු.මිලියන 900 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 791 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 88 ක් වී තිබුණි.

## 2.9 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 32201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 29.00 | 29.00 | 17.50 | 18.80 | 83.00 | 68.86 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.675,596 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 2.10 මානව සම්පත් කළමනාකරණය

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩි නඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 294 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.467,118 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 34 | 16 | 18 |
| (ii) | ද්විතියික මට්ටම | 189 | 130 | 59 |
| (iii) | තෘතියික මට්ටම | 10 | 04 | 06 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 741 | 480 | 261 |
| | **එකතුව** | **974** | **630** | **344** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) විධිමත් අනුමැතියකින් තොරව කම්කරුවන් සේවයේ යෙදවීම**

**-----------------------------------------------------------------**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව උද්‍යානවල දෛනික කටයුතු වෙනුවෙන් තත්කාර්ය පදනම මත සේවකයින් බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 14 ක් උද්භිද උද්‍යාන භාර අරමුදලින් ගෙවා තිබුණි.

**(ආ) කාර්ය මණ්ඩල පුහුණු කිරීම්**

**------------------------------**

කාර්ය මණ්ඩලය නිතිපතා පුහුණු කිරීමේ අවශ්‍යතාවයක් ඇති බැවින් එක් එක් තනතුරු හා විෂයයන්වලට අදාළව පුහුණු අවශ්‍යතා හඳුනා ගනිමින් එම අවශ්‍යතා සපුරාලීම සඳහා පුහුණු වැඩසටහන් සැලැසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි.